487

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
විද්‍යාවේදී උපාධි පාඨමාලාව - මට්ටම 03
අවසාන පරීක්ෂණය -2025 / 2026
**LLU 3261 / LWU 1161** - නීතිය පිළිබඳ අවබෝධය
කාලය පැය 02 යි.

---

දිනය : **2026** ජනවාරි 06 වේලාව: ප .ව 1 .30 - ප.ව 3.30

---

සම්පූර්ණ ප්‍රශ්න ගණන : 06
<u>ප්‍රශ්න 04 කට පමණක්</u> පිළිතුරු සපයන්න.
එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 25 බැගින් පිරිනැමේ.
අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. ( I ). පහත නඩු විභාග කිරීම සඳහා නිසි අධිකරණ බලය සහිත අධිකරණය හඳුනාගන්න. ඔබේ පිළිතුර සඳහා හේතු සපයන්න.

(අ). සමන් පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබුවේ සුළු වරදක් සඳහා ය. ඔහු පොලිස් අත්අඩංගුවේ සිටියදී, පොලිස් නිලධාරීන් විසින් ඔහුට පහර දී වාචිකව අපයෝජනය කරන ලදී. රාජ්‍ය අධිකාරියක් මගින් තමන් කෲර හා අවමන් සහගත සැලකිලිවලට භාජනය වී ඇති බව ඔහු විශ්වාස කරන අතර ඒ සඳහා නීතිමය පියවර ගැනීමට බලාපොරොත්තු වේ.

(ආ). කාන්ති සහ නිමල් වසර 5ක සිට විවාහ වී සිටී. ඔවුන්ට දැන් අවශ්‍ය වන්නේ නීත්‍යානුකූලව වෙන් වී දරුවන්ගේ භාරකාරත්වය සහ නඩත්තුව සම්බන්ධයෙන් කටයුතු කිරීමටයි.

(ඇ). ජනාකීර්ණ බස් රථයක දී, හිමිකරුගේ අවධානය වෙනතකට යොමු වී තිබියදී සමීර මුදල් පසුම්බියක් සොරකම් කළේ ය. බස් කොන්දොස්තර සිද්ධිය බලධාරීන්ට වාර්තා කළේය.

(05 x 3 = ලකුණු 15)

( II ). ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය සතුව පවතින අධිකරණ බලයන් පහක් සුදුසු උදාහරණ සහිතව විග්‍රහ කරන්න.

( ලකුණු 10 )

02. (I). “ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ උත්තරීතර ම නීතිය ලෙස සලකනු ලැබෙයි.” මෙම ප්‍රකාශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික සංකල්ප ඇසුරෙන් සාකච්ඡා කරන්න.

( ලකුණු 10 )

(II). 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් මොනවා ද ? සුදුසු උදාහරණ ඇසුරෙන් කෙටියෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 15)

03. (I). "සෑම පුද්ගලයෙකුට ම ගිවිසුම්වලට එළඹීමට නිදහස ඇත. නමුත් නීතිය ඇතැම් සුවිශේෂී පුද්ගලයන්ට පූර්ණ ගිවිසුම්ක හැකියාව ලබාදීම සීමා කරයි." මෙම කරුණ පාර්ශවයන්ගේ ගිවිසුම්ක හැකියාව ඇසුරෙන් කෙටියෙන් සාකච්ඡා කරන්න.

( ලකුණු 10 )

(II). අර්පණය හා සැලකීමට කරනු ලබන ආරාධනය අතර වෙනස්කම් සාකච්ඡා කරන්න.

( ලකුණු 7 )

(III). ගිවිසුමක් කඩවීමකදී පවතින ප්‍රතිකර්ම පැහැදිලි කරන්න.

( ලකුණු 8 )

04. (I). රශ්මි "ක්වික්මාර්ට්" නමින් කුඩා වෙළඳසැලක් පවත්වාගෙන යයි. පසුගිය සතියේ ඇගේ වෙළඳසැලේ ගනුදෙනුකරුවන් කිහිප දෙනෙකුට ගැටළු ඇති විය. සීනි සහ පිසින තෙල් වෙළඳසැලේ තිබුණ ද, ඇය ඒවා විකිණීම ප්‍රතික්ෂේප කළේ ඒවා "විශේෂ ගනුදෙනුකරුවන් සඳහා ඉතිරි කරන" බව පවසමිනි. ඇය රු. 1,200 ක් ලෙස මිල සලකුණු කර ඇති පිසින තෙල් බෝතලයක් සඳහා රු. 1,500 ක් ද අය කළාය. රශ්මි ඇගේ ගබඩා කාමරයේ සහල් සහ තිරිඟු විශාල ප්‍රමාණයක් තබාගෙන ඒවා අලෙවි නොකළ අතර, හිඟයක් ඇති කළාය. වෙළඳසැලේ මිල ලැයිස්තුවක් ප්‍රදර්ශනය කර නොතිබූ අතර, ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ මිලදී ගැනීම් සඳහා රිසිට්පත් නොලැබුණි. තවද ඇය ඇතැම් ද්‍රව්‍යවලට හානි ඇති කළ හැකි පිරිසිදු කිරීමේ නිෂ්පාදනයක් "සියලු මතුපිට සඳහා සම්පූර්ණයෙන් ම ආරක්ෂිතයි" ලෙස දක්වමින් ප්‍රචාරය කළාය.

ඉහත අවස්ථාවට අදාළව, 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු අධිකාරි පනත යටතේ රශ්මි සිදු කළ වැරදි හඳුනාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(II). 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු අධිකාරි පනත යටතේ කොමසාරිස්වරයාගේ කාර්යයන් සාකච්ඡා කරන්න.

( ලකුණු 10 )

05. (I). විවිධ මාදිලියේ රැකියා වර්ග සුදුසු උදාහරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

( ලකුණු 10 )

(II). නදීෂා "සන්රයිස් සර්විසස් (පුද්) සමාගම" නම් පෞද්ගලික සමාගමකට පිළිගැනීමේ සේවා නිලධාරිනියක් වශයෙන් සේවය සපයයි. ඇය, කළමනාකාරිත්වය විසින් තීරණය කරන ලද ස්ථාවර වැඩ කරන වේලාවන් තුළ සමාගමේ කාර්යාලයේ සේවය කරන අතර කාර්යාල කළමනාකරු විසින් ඇගේ දෛනික රාජකාරි සම්බන්ධයෙන් ලබා දෙන උපදෙස් පිළිපැදීමට ඇය බැඳී සිටී. සමාගම ඇගේ වැඩ කටයුතු සමීපව අධීක්ෂණය කරන අතර ඇගේ කාර්යයන් ඉටු කළ යුතු ආකාරය සහ කවදාද යන්න තීරණය කරයි. නදීෂා සමාගමේ උපකරණ භාවිත කිරීමත් සෑම දිනකම ඇගේ පැමිණීම වාර්තා කිරීමත් සිදුකරන අතර, සමාගම විසින් ඇයට ස්ථාවර මාසික මුදලක් ගෙවනු ලැබේ. කෙසේ වෙතත්, සමාගම කියා සිටින්නේ නදීෂා සේවකයෙකු නොව ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු වන බවයි.

ඉහත කරුණු මත පදනම්ව, නදීෂාගේ රැකියාවේ ස්වභාවය අයත් වන්නේ රැකියා ගිවිසුමකට (Contract of employment) ද නැතිනම් රැකියා සඳහා ගිවිසුමකට (Contract for employment) ද යන වග සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

06 . පහත සඳහන් ඕනෑ ම පහක් (05) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) නීතියේ මූලාශ්‍ර

(ii) ඉංග්‍රීසි නීතිය

(iii) මූලික අයිතිවාසිකම් සඳහා වන සීමා

(iv) අර්පණය අවසන් වීම

(v) පාරිභෝගික අයිතිවාසිකම්

(vi) ගිවිසුමක බැහැර කිරීමේ වගන්ති

( 05 x 5 = ලකුණු 25 )

*** හිමිකම් ඇවිරිණි ***